// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1981/32 - 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2016.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝගය

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016.06.28 දිනැති අංක 1973/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනයේ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය 22.02 යටතේ නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩවලට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති අනුප්‍රමාණය පරිදි 2016.08.24 දින සිට බලපැවැත්වෙන ලෙස සෙස් බද්ද සංශෝධනය කරනු ලබන බව ප්‍රකාශ කරමි.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 01,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *සං.ව. ශීර්ෂය* <br> *I* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* <br> *II* | | *විස්තර* <br> *III* | *සෙස් බදු ප්‍රමාණය* <br> *IV* |
|---|---|---|---|---|
| **22.02** | | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග.** | |
| | | | | |
| | 2202.10 | - | සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළාවූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | 35% හෝ ලීටරයට රු. 110/- |

09 - 286

1A - PG 3078 — 507 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*